අංක 20, R.G සේනානායක මාවත, කොළඹ 7
දුරකථන, 94-11-2693831~3, ෆැක්ස්, 94-11-2698629

# පුවත්පත් නිවේදනය

29, ඔක්තොබර් 2014

## ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට ජපන් රජයෙන් ගිනි නිවන රථ සහ උපකරණ

ජපන් තානාපති නොහිබුතෝ හෝබෝ මහතා විසින් ගිනි නිවන රථ 05 ක් හා උපකරණ ශ්‍රී ලංකා අයෝජන මණ්ඩලය වෙනුවෙන් ආයෝජන ප්‍රවර්ධන ගරු අමාත්‍ය ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතාට නිල වශයෙන් කටුනායක අපනයන සැකසුම් කලාපයේදී  බාර දෙනු ලැබිය.

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරනු ලැබූ ‘අපනයන සැකසුම් කලාපයන්හි ගිනි නිවන ඒකක ශක්තිමත් කිරමේ ව්‍යාපෘතිය’ සඳහා ඇමරිකානු ඩොලර් 83,735 ක් (දළ වශයෙන් ශ්‍රී ලංකා රුපියල්  මිලියන 10) ජපන් රජයේ බිම් මට්ටමේ මානව ආරක්ෂණය උදෙසා ආධාර ව්‍යාපෘතිය යටතේ ප්‍රදානය කරන ලදි. මෙම ව්‍යාපෘතිය යටතේ ලබා දුන් ආධාර මඟින් ශ්‍රී ලංකා අයෝජන මණ්ඩලය විසින් එහි ක්‍රියාත්මක කලාප තුල ආරක්ෂාව ඉහල නංවමින් උසස් තත්වයේ සේවයක් ඉටුකිරීමට ගිනි නිවන රථ 05 ක් හා උපකරණ ප්‍රදානය කළ අතර ඒවා කටුනායක, බියගම හා සීතාවක අපනයන සැකසුම් කලාපයන්ගේ පවතින කර්මාන්ත ශාලා, යන්ත්‍රෝපකරණ, රසායනික ද්‍රව්‍ය ගබඩා ආදියේ ආරක්ෂාව සඳහා යොදවනු ඇත.

ශ්‍රී ලංකා අයෝජන මණ්ඩලයේ සභාපති අචාර්ය ලක්ෂ්මන් ජයවිර මහතා පැවසුයේ මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් ජපන් රජයට අතිශය කෘතඥ වන බවත්, මෙය ශ්‍රී ලංකාව හා ජපානය අතර පවතින අති සමිප සම්බන්ධතාවය තවත් ශක්තිමත් කරන බවත්ය.

මෙම ප්‍රදානය ශ්‍රී ලංකා අයෝජන මණ්ඩලය යටතේ පවතින කටුනායක, බියගම හා සීතාවක අපනයන සැකසුම් කලාපයන්ගේ කර්මාන්ත ශාලා ආදියේ ආරක්ෂාව ඉහළ නංවන අතර ශ්‍රී ලංකාව හා ජපානය අතර පවතින මිත්‍රත්වය තවදුරටත් ශක්තිමත් කරනු ඇත.




වැඩි විස්තර සඳහා, කරුණාකර විමසන්න
සංස්කෘතික හා තොරතුරු අංශය, ජපන් තානාපති කාර්යාලයය
දුරකථන 011-2693831 දිගු අංකය 225

ඊ මේල් : cultujpn@co.mofa.go.jp